# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය -2025

දිවයින පුරා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පුරප්පාඩුව පවතින ග්‍රාම නිලධාරි කොට්ඨාසවලට ග්‍රාම නිලධාරින් පත් කිරීම සඳහා සුදුස්සන් තෝරා ගැනීම පිණිස පවත්වනු ලබන ලිඛිත විභාගයට පෙනී සිටීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ස්ත්‍රී/ පුරුෂ දෙපක්ෂයෙන් අයදුම්පත් කැඳවනු ලබන අතර එම විභාගය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් **2025 දෙසැම්බර් මස** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. අයදුම්කරුවකුට පහත 06 වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව සුදුසුකම් ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවත්නා පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ හැකිය.

03. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා අයත් දිස්ත්‍රික්ක සහ අයත් පළාත් පිළිබඳ තොරතුරු I වැනි උපලේඛනයේ දැක්වේ. අයදුම්කරුවන් තමා ඉල්ලුම් කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා එහි අංකයත්, දිස්ත්‍රික්කයේ නම හා අංකයත්, පළාතේ නම හා අංකයත් එම උපලේඛනයේ සඳහන් පරිදි නිවැරදිව අයදුම්පතේ නියමිත ස්ථානයේ සඳහන් කළ යුතුය. එය පසු අවස්ථාවක වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. එම විස්තර වැරදි ලෙස සටහන් කිරීම හේතුවෙන් අයදුම්කරුවකුට සිදුවන කිසියම් අවාසියක් සම්බන්ධ කිසිදු ඉල්ලීමක් සලකා නොබලන අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා කොට්ඨාස අංකය සඳහන් කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**04.** **තරග විභාගය පිළිබඳ විස්තර:**

4.1 විභාග මාධ්‍යය - මෙම විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් I වැනි උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික්ක තුළ දී පවත්වනු ඇත. එහෙත් විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීමට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම් කර නොමැති දිස්ත්‍රික්කවල අයදුම්කරුවන් ආසන්න වෙනත් දිස්ත්‍රික්කයක විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. අපේක්ෂකයන් එක් භාෂා මාධ්‍යයකින් පමණක් පෙනී සිටිය යුතුය. ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ ලබා දෙනු නොලැබේ.

4.2 ග්‍රාම නිලධාරින් බඳවා ගැනීමේ තරග විභාගය, පහත සඳහන් ප්‍රශ්න පත්‍ර 03කින් සමන්විත වේ.

| විෂයය | ලකුණු සංඛ්‍යාව | සමත් වීමට ලැබිය යුතු අවම ලකුණු සංඛ්‍යාව | කාලය |
|---|---|---|---|
| 01. භාෂා භාවිතය හා අවබෝධය | 100 | 40 | පැය 1 1/2 |
| 02. දේශීය හා ගෝලීය ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනීම | 100 | 40 | පැය 1 1/2 |
| 03.අභියෝග්‍යතාව | 100 | 40 | පැය 1 |

4.3 **ලිඛිත විභාගයේ විෂය නිර්දේශය :**

4.3.1 භාෂා භාවිතය හා අවබෝධය:

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, දෙන ලද ලිපියක් කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්ථාර, වගු සකස් කිරීම, දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය කිහිපයක අදහස තනි වාක්‍යයකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය.

4.3.2 දේශීය හා ගෝලීය ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනීම:

මෙම ප්‍රශ්න පත්‍රය මඟින් රටෙහි ඓතිහාසික, භූගෝලීය, සාමාජීය හා ආර්ථික වශයෙන් වැදගත් වන තොරතුරු හා දේශීය හා විදේශීය කාලීන තොරතුරු පිළිබඳ අපේක්ෂකයන්ගේ සාමාන්‍ය දැනීම මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය.

4.3.3 අභියෝග්‍යතාව

මෙම ප්‍රශ්න පත්‍රය මඟින් අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවන්, තර්කණ ශක්තිය, ගැටලු නිරාකරණය, තීරණ ගැනීමේ හැකියාව ඇතුළු සාමාන්‍ය බුද්ධිය ආදිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ.

4.4 ලිඛිත පරීක්ෂණයෙන් වැඩිම ලකුණු ලබාගැනීමේ අනුපිළිවෙළ අනුව අයදුම්කරුවන් ප්‍රමුඛතාගත

කිරීමේ දී එක් එක් විෂයයට 40%ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබා ඇති අයදුම්කරුවන් පමණක් සැලකිල්ලට ගනු ලැබේ.

05. බඳවා ගැනීමේ ක්‍රමය:

(i) ලිඛිත විභාගයෙන් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වැඩිම ලකුණු ලබා ඇති අයදුම්කරුවන් අතරින් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක අයදුම්කරුවන් සංඛ්‍යාවක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. ලිඛිත විභාගයේ සහ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල එකතුවෙන් වැඩිම ලකුණු ලබා සුදුසුකම් ලබන අයදුම්කරුවන් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා පුහුණු පාඨමාලාවකට තෝරා ගනු ලැබේ.

ඒ යටතේ පහත ව්‍යතිරේකය ඇතුළත් වේ.

(අ) එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක පවතින පුරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණ කිරීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සුදුසුකම් නොලබා ඇති අවස්ථාවක දී එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටි දිස්ත්‍රික්කයේ විභාගය සමත් අයදුම්කරුවන්ගේ දිස්ත්‍රික් කුසලතා අනුපිළිවෙළ අනුව ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාව පුරවනු ලැබේ. (මේ යටතේ බඳවා ගැනීම සඳහා පමණක් *ගැසට්* නිවේදනයේ 6.1 යටතේ සඳහන් සුදුසුකමේ "ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ" යන්න "දිස්ත්‍රික්කය තුළ" ලෙස සලකනු ලැබේ.)

(ii) ඉහත 5(i) ඡෙදයේ සඳහන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ආකාරයට ලකුණු ලබාදෙනු ඇත.

(අ)

| ලකුණු දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| නායකත්වය | 15 |
| ක්‍රීඩා කුසලතා | 05 |
| අනෙක් රාජ්‍ය භාෂාව හෝ සන්ධාන භාෂා ප්‍රවීණතාව | 10 |
| පරිගණක දැනුම | 10 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | 10 |
| එකතුව | 50 |

(ආ) **ලකුණු ලබාදීමේ දී සලකා බලනු ලබන්නේ රාජ්‍ය ආයතනයකින්/දෙපාර්තමේන්තුවකින් විධිමත්ව නිකුත් කරන ලද සහතික සහ අදාළ කරුණු සනාථ කිරීම සම්බන්ධයෙන් වගකීම පැවරෙන රජයේ දෙපාර්තමේන්තු, ආයතනවල මාණ්ඩලික මට්ටමේ නිලධාරීන් නිකුත් කරන ලද නිල මුද්‍රාව සහිත සනාථ කිරීමේ ලිපි පමණි. උදාහරණ වශයෙන් දහම් පාසල් ගුරුවරයකු ලෙස කටයුතු කිරීම, ග්‍රාම සංවර්ධන සමිතියක නිලතල දැරීම, ක්‍රීඩා සමාජයක නිලතල දැරීම වැනි කරුණු ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සනාථ කළ යුතුය.**

(ඇ) ග්‍රාම නිලධාරීන්ට දේශපාලන අයිතිවාසිකම් නොමැති බැවින් දේශපාලන මට්ටමේ සංවිධානවල නිලතල දැරීම සම්බන්ධයෙන් ලකුණු ලබාදෙනු නොලැබේ. උදාහරණ වශයෙන් ප්‍රාදේශීය සභා/නගර සභා මන්ත්‍රීවරුන්, සමුපකාර සමිති අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වැනි දේශපාලන පක්ෂ නියෝජනයෙන් ලබා ගන්නා තනතුරු දැක්විය හැකිය.

(iii) මාස තුනක්වන පුහුණු පාඨමාලාව දිස්ත්‍රික් ලේකම්ගේ අධීක්ෂණය යටතේ පවත්වන අතර එම පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කරන ලද බවට දිස්ත්‍රික් ලේකම්වරයා විසින් නිර්දේශ කරන අය මවිසින් ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී සේවයේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ. පුහුණු කාලය සඳහා රු. 17,800.00ක දීමනාවක් පමණක් ගෙවනු ලබන අතර එම කාලය තුළ නිවාඩු හිමිකම් නොමැත. පාඨමාලාව පැවැත්වෙන දින ගණනින් 80% අවම වශයෙන් සහභාගී විය යුතුය. පුහුණු වැඩසටහන යටතේ පැවැත්වෙන ලිඛිත පරීක්ෂණයෙන් සමත්වීම සඳහා 50%ක් ලකුණු ලබාගත යුතු ය. එලෙස එම ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව සාර්ථකව අවසන් නොකෙරෙන්නේ නම් හෝ අංක 31/91(1) හා 1991.09.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව ජාතික ආරක්ෂක තොරතුරු කාර්යාංශයෙන් ලබා ගන්නා ආරක්ෂාව පිළිබඳ සතුටුදායක ආරක්ෂක නිශ්කාශන වාර්තාවක් නොලැබීම මත හෝ මෙම ආධුනික නිලධාරියාගේ සේවය අවසන් කරනු ලැබේ. මෙම

ත්‍රෛමාසික පුහුණු කාලය සේවා කාලයට ගණනය කරනු නොලබන අතර එම කාලය විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව විශ්‍රාම වැටුප් ගණනය සඳහා පමණක් අදාළ කරගනු ඇත.

(iv) කුසලතා අනුපිළිවෙළ මත සකස් කරන ලද ප්‍රමුඛතා ලේඛනය පදනම් කොට ගෙන පත් කිරීමේ දී අවසාන පුරප්පාඩුව හෝ අවසන් පුරප්පාඩු කිහිපයක් සඳහා හෝ සම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් වැඩි සංඛ්‍යාවක් සිටින අවස්ථාවක එම පුරප්පාඩුව හෝ පුරප්පාඩු කිහිපය හෝ පිරවීම පිළිබඳ මව්සින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් විමසා තීරණය කරනු ලැබේ.

06. අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම්: අපේක්ෂකයන් අවම වශයෙන් පහත දැක්වෙන සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.

6.1 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වර්ෂ හයක (06) කාල සීමාවක් ඇතුළත අපේක්ෂකයා තමා තනතුරට පත්වීමට බලාපොරොත්තුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අවම වශයෙන් වසර තුනක කාලසීමාවක් (03) අඛණ්ඩව ස්ථිරව පදිංචිව සිටිය යුතුය. ඒ බව පහත සඳහන් සහතිකවලින් එකක් මඟින් තහවුරු කළ යුතුය.

1. ඡන්දහිමි නාම ලේඛනය
2. ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකය

6.2 වයස් සීමාව - අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 21ට නොඅඩු සහ 35 ට නොවැඩි අයකු විය යුතුය. (ඒ අනුව 2004.11.24 වැනි දින හෝ ඊට පෙර හා 1990.11.24 වැනි දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

6.3 අධ්‍යාපන සුදුසුකම් - අයදුම්කරුවන්ට පහත සඳහන් පරිදි අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතුය.

(අ) පළමු භාෂාව ලෙස සිංහල හෝ දෙමළ භාෂා අතරින් එක් භාෂා විෂයයක් සමඟ ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමර්ථ්‍ය සහිතව **එක් වරක දී** විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

*සහ*

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම. පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් (03) එකවර සමත්ව තිබීම.

6.4 අපේක්ෂකයන්-

1. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය;
2. සාපරාධී ක්‍රියාවන් සම්බන්ධව අධිකරණයේ වරදකරුවකු කරනු ලැබුවකු නොවිය යුතු අතර ඉතා හොඳ චරිතයකින් යුත් අයෙකු විය යුතුය;
3. රජයේ හෝ රජයේ සංස්ථාවක හෝ රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක සේවයෙන් පහකළ අයෙකු, සේවය හැරගිය අයෙකු හෝ අකාර්යක්ෂමතාව මත විශ්‍රාම ගැන් වූ අයෙකු හෝ නොවිය යුතුය;
4. වස්තු භංගත්වයට පත් වී ඇති තැනැත්තකු නොවිය යුතුය;
5. යම් ආගමක හෝ ආගමික නිකායක පැවිදිවරයක් දරන තැනැත්තකු නොවිය යුතුය;
6. මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමඟ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

07. තනතුරට අදාළ මාසික වැටුප් ක්‍රමය :

වැටුප් පරිමාණය - රු.50,630 - 10x540 - 11 x 630 - 10 x 1010 - 10 x 1190 - රු.84,960

(අංක 10/2025 හා 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි උපලේඛනය (ii) හි විධිවිධානවලට යටත්ව ගෙවීම් කරනු ලැබේ.)

08. සේවා කොන්දේසි:

8.1 බඳවා ගැනීම සිදු කරනු ලබන්නේ ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සේවයේ III ශ්‍රේණියට ය.

8.2 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත වේ. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතුය. වැන්දඹු අනත්දරු/පුරුෂ අරමුදල සඳහා දායක විය යුතුය. මාස 03ක පුහුණු කාලය ග්‍රාම නිලධාරි සේවා කාලයට ගණන් ගනු නොලැබේ.

8.3 මුල් පත්වීම් දින සිට වසර තුනක් පත්කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අනිවාර්යයෙන් සේවය කළ යුතුය.

8.4 සතියට එක් විවේක දිනයක් හිමි අතර එම දිනය හැර සතියේ අනෙක් දිනයන්හි පැය 24 තුළ රාජකාරි සඳහා පත්කරනු ලබන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ රාජකාරි ඉටු කිරීම සඳහා බැඳී සිටියි.

8.5 මෙම තනතුර සඳහා පත්වන අයෙකු අනුමත සේවා ව්‍යවස්ථාවේ, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන, රෙගුලාසිවලට ද රජය විසින් පනවන ලද හා ඉදිරියේ පනවනු ලබන රෙගුලාසි හා විධිවිධානවලට ද යටත් වේ.

09. අයදුම්පත් එවිය යුතු ආකාරය:

9.1 අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති Online Applications – Recruitment Exams/ E.B.Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි.

මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 ඔක්තෝබර් මස 24 දින පෙ.ව. 09.00**ට විවෘතවන අතර **2025 නොවැම්බර් මස 24 දින ප.ව. 09.00**ට අවසන් වේ.

9.2 දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

9.3 අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතුය.

9.4 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.5 විභාග ගාස්තුව රු.1000/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

I. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)

II. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)

III. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මඟින් (Online Banking Method of Bank of Ceylon)

IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of the Bank of Ceylon)

(අ) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවිඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහාවන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

10. විභාගයට පෙනී සිටීම හා ප්‍රතිඵල නිකුත් කිරීම.

10.1. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

10.2. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයකුම විභාග දිනයේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපතිවරයා වෙත භාරදිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

10.3 විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි, රජයේ පාසලක ප්‍රධානියකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමින් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

10.4 ප්‍රතිඵල නිකුත් කිරීම.

*ගැසට්* නිවේදනයේ 4.4 ඡේදයට අනුව ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූවන්ගේ නාම ලේඛන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව වෙන් වෙන් වශයෙන් ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත. සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලැබීමෙන් අනතුරුව සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූ සියලුම අයදුම්කරුවන්ගේ ලිඛිත හා සම්මුඛ පරීක්ෂණ ලකුණුවල මුළු ලකුණු ප්‍රමුඛතාව මත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් සකස් කළ ප්‍රතිඵල ලේඛන ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත.

පසුව, *ගැසට්* නිවේදනයේ 05.(i) හි (අ) සහ 4.4 ඡේදයට අනුව ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූවන්ගේ නාමලේඛන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා දිස්ත්‍රික් මට්ටමින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව වෙන් වෙන් වශයෙන් ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත. සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලැබීමෙන් අනතුරුව සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූ සියලුම අයදුම්කරුවන්ගේ ලිඛිත හා සම්මුඛ පරීක්ෂණ ලකුණුවල මුළු ලකුණු ප්‍රමුඛතාව මත දිස්ත්‍රික් මට්ටමෙන් සකස් කළ ප්‍රතිඵල ලේඛන ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත.

විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ දැනුම්දීම අනුව සිදුකරනු ඇත.

11. සියලුම විභාග අපේක්ෂකයන් රජයේ *ගැසට්* පත්‍රයේ පළකරන විභාග නීතිරීති පිළිබඳ අවබෝධයක් ලබා සිටිය යුතු අතර, ඒවා පිළිපැදීමට බැඳී සිටිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට අපේක්ෂකයන්ට සිදු වේ.

12. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති

බවට පිළිගැනීමක් ලෙස නොසැලකෙන අතර අයදුම්පත් වැරදි සහගතව හා අසම්පූර්ණව ඉදිරිපත් කර යම්කිසි අවාසියක් වෙතොත් අපේක්ෂකයා විසින්ම එය විඳ දරාගත යුතුය. එවැනි කරුණු සම්බන්ධ කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ.

13. **අංක අමප/25/0855/802/004 – IV හා 2025.05.26 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ගණනය කරන ලද පුරප්පාඩු ප්‍රමාණය පිරවීම සඳහා මෙම බඳවා ගැනීම සිදුකරන අතර, බඳවා ගනු ලබන දිනය වනවිට වාර්ෂික ස්ථාන මාරු හා අනෙකුත් ස්ථාන මාරු කිරීම් හේතුවෙන් 1 උපලේඛනයේ සඳහන් සමහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පුරප්පාඩු සම්පූර්ණ වී තිබීමට ඉඩ ඇති බව අපේක්ෂකයන්ගේ අවධානයට ලක්කරනු ලැබේ. එවැනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලින් ඉදිරිපත්වන අපේක්ෂකයන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් බඳවා ගැනීමේ දී වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක පවතින පුරප්පාඩු සඳහා සුදුසුකම් ලැබීමට හිමිකම් නොලබන බව ද අවධාරණය කරනු ලැබේ.**

14. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් මඟින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ මුද්‍රිත පිටපත සූදානමින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේදී / සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

15. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

16. මෙම නිවේදනය මඟින් අනාවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

**එස්.ආලෝකබණ්ඩාර**
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

2025 ඔක්තෝබර් මස 16 වැනි දින
"නිල මැදුර", ඇල්විටිගල මාවත,
කොළඹ 05.

උපලේඛනය I

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* | *අයත් පළාත හා අංකය* |
|---|---|---|---|
| කොළඹ | 1103 | 01 කොළඹ | 01 බස්නාහිර පළාත |
| කොලොන්නාව | 1106 | | |
| කඩුවෙල | 1109 | | |
| හෝමාගම | 1112 | | |
| සීතාවක (හංවැල්ල) | 1115 | | |
| පාදුක්ක | 1118 | | |
| මහරගම | 1121 | | |
| ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ | 1124 | | |
| තිඹිරිගස්යාය | 1127 | | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය | අයත් පළාත හා අංකය |
|---|---|---|---|
| දෙහිවල | 1130 | 01 කොළඹ | 01 බස්නාහිර පළාත |
| රත්මලාන | 1131 | | |
| මොරටුව | 1133 | | |
| කැස්බෑව | 1136 | | |
| | | | |
| මීගමුව | 1203 | 02 ගම්පහ | |
| කටාන | 1206 | | |
| දිවුලපිටිය | 1209 | | |
| මීරිගම | 1212 | | |
| මිනුවන්ගොඩ | 1215 | | |
| වත්තල | 1218 | | |
| ජා ඇල | 1221 | | |
| ගම්පහ | 1224 | | |
| අත්තනගල්ල | 1227 | | |
| දොම්පේ | 1230 | | |
| මහර | 1233 | | |
| කැලණිය | 1236 | | |
| බියගම | 1239 | | |
| | | | |
| පානදුර | 1303 | 03 කළුතර | |
| බණ්ඩාරගම | 1306 | | |
| හොරණ | 1309 | | |
| ඉංගිරිය | 1310 | | |
| බුලත්සිංහල | 1312 | | |
| මදුරාවල | 1315 | | |
| මිල්ලනිය | 1318 | | |
| කළුතර | 1321 | | |
| බේරුවල | 1324 | | |
| දොඩන්ගොඩ | 1327 | | |
| මතුගම | 1330 | | |
| අගලවත්ත | 1333 | | |
| පාලින්දනුවර | 1336 | | |
| වලල්ලාවිට | 1339 | | |
| | | | |
| තුම්පනේ | 2103 | 04 මහනුවර | 02 මධ්‍යම පළාත |
| පූජාපිටිය | 2106 | | |
| අකුරණ | 2109 | | |
| පන්විල | 2115 | | |
| උඩුදුම්බර | 2118 | | |
| මිනිපේ | 2121 | | |

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* | *අයත් පළාත හා අංකය* |
|---|---|---|---|
| මැදදුම්බර | 2124 | 04 මහනුවර | 02 මධ්‍යම පළාත |
| කුණ්ඩසාලේ | 2127 | | |
| ගඟවට කෝරළේ | 2130 | | |
| හාරිස්පත්තුව | 2133 | | |
| හතරලියද්ද | 2134 | | |
| යටිනුවර | 2136 | | |
| උඩුනුවර | 2139 | | |
| දොළුව | 2142 | | |
| පාතහේවාහැට | 2145 | | |
| දෙල්තොට | 2148 | | |
| උඩපළාත | 2151 | | |
| ගඟඉහළ කෝරළේ | 2154 | | |
| පස්බාගෙ කෝරළේ | 2157 | | |
| | | | |
| ගලේවෙල | 2203 | 05 මාතලේ | |
| දඹුල්ල | 2206 | | |
| නාඋල | 2209 | | |
| පල්ලේපොල | 2212 | | |
| යටවත්ත | 2215 | | |
| මාතලේ | 2218 | | |
| අඹන්ගඟ කෝරළේ | 2221 | | |
| ලග්ගල පල්ලේගම | 2224 | | |
| විල්ගමුව | 2227 | | |
| රත්තොට | 2230 | | |
| උකුවෙල | 2233 | | |
| | | | |
| කොත්මලේ | 2303 | 06 නුවරඑළිය | |
| කොත්මලේ බටහිර | 2304 | | |
| හඟුරන්කෙත | 2306 | | |
| මතුරට | 2307 | | |
| වලපනේ | 2309 | | |
| නිල්දණ්ඩාහින්න | 2310 | | |
| තලවකැලේ | 2313 | | |
| නෝර්වුඩ් | 2316 | | |
| | | | |
| බෙන්තොට | 3103 | 07 ගාල්ල | 03 දකුණු පළාත |
| බලපිටිය | 3106 | | |
| කරන්දෙණිය | 3109 | | |
| ඇල්පිටිය | 3112 | | |
| නියාගම | 3115 | | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය | අයත් පළාත හා අංකය |
|---|---|---|---|
| නෙළුව | 3121 | 07 ගාල්ල | 03 දකුණු පළාත |
| නාගොඩ | 3124 | | |
| බද්දේගම | 3127 | | |
| වදුරඹ | 3128 | | |
| වැලිවිටිය දිවිතුර | 3130 | | |
| අම්බලන්ගොඩ | 3133 | | |
| මාදම්පාගම | 3138 | | |
| කඩවත්සතර | 3139 | | |
| බෝපෙ පෝද්දල | 3142 | | |
| අක්මීමන | 3145 | | |
| යක්කලමුල්ල | 3148 | | |
| ඉමදූව | 3151 | | |
| ගෝනපීනුවල | 3154 | | |
| හබරාදූව | 3157 | | |
| | | | |
| පිටබැද්දර | 3203 | 08 මාතර | |
| කොටපොල | 3206 | | |
| පස්ගොඩ | 3209 | | |
| මුලටියන | 3212 | | |
| අතුරලිය | 3215 | | |
| අකුරැස්ස | 3218 | | |
| වැලිපිටිය | 3221 | | |
| මාලිම්බඩ | 3224 | | |
| කඹුරුපිටිය | 3227 | | |
| හක්මන | 3230 | | |
| කිරින්ද පුහුල්වැල්ල | 3233 | | |
| වැලිගම | 3239 | | |
| මාතර | 3242 | | |
| දෙවිනුවර | 3245 | | |
| | | | |
| සූරියවැව | 3303 | 09 හම්බන්තොට | |
| ලුණුගම්වෙහෙර | 3306 | | |
| තිස්සමහාරාමය | 3309 | | |
| හම්බන්තොට | 3312 | | |
| අම්බලන්තොට | 3315 | | |
| අඟුණකොළපැලැස්ස | 3318 | | |
| වීරකැටිය | 3321 | | |
| කටුවන | 3324 | | |
| ඕකේවෙල | 3327 | | |
| බෙලිඅත්ත | 3330 | | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය | අයත් පළාත හා අංකය |
|---|---|---|---|
| තංගල්ල | 3333 | 09 හම්බන්තොට | 03 දකුණු පළාත |
| වලස්මුල්ල | 3336 | | |
| | | | |
| කයිට්ස් | 4103 | 10 යාපනය | 04 උතුරු පළාත |
| වංකානෙයි | 4106 | | |
| සන්දිලිපායි | 4109 | | |
| තෙල්ලිපලෙයි | 4112 | | |
| උඩුවිල් | 4115 | | |
| කෝපායි | 4118 | | |
| කරවෙඩ්ඩි | 4121 | | |
| මරුතන්කේනි | 4124 | | |
| පේදුරුතුඩුව | 4127 | | |
| චාවාකච්චේරි | 4130 | | |
| නල්ලූර් | 4133 | | |
| යාපනය | 4136 | | |
| වෙලනෛ | 4139 | | |
| කාරෛනගර් | 4145 | | |
| | | | |
| මන්නාරම | 4203 | 11 මන්නාරම | |
| මාන්තායි බටහිර | 4206 | | |
| මඩු | 4209 | | |
| නානට්ටාන් | 4212 | | |
| මුසලි | 4215 | | |
| | | | |
| වවුනියා උතුර | 4303 | 12 වවුනියා | |
| වවුනියා දකුණ | 4306 | | |
| වවුනියා | 4309 | | |
| වෙන්ගලචෙට්ටිකුලම් | 4312 | | |
| | | | |
| තුනුක්කායි | 4403 | 13 මුලතිව් | |
| මාන්තායි නැගෙනහිර | 4406 | | |
| පුදුකුඩිඉරුප්පු | 4409 | | |
| ඔඩ්ඩුසුඩ්ඩාන් | 4412 | | |
| මැරිටයිම්පත්තු | 4415 | | |
| වැලිඔය | 4418 | | |
| | | | |
| කරච්චි | 4509 | 14 කිලිනොච්චිය | |
| පූනකරි | 4512 | | |
| | | | |

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* | *අයත් පළාත හා අංකය* |
|---|---|---|---|
| කෝරළේපත්තු උතුර | 5103 | 15 මඩකලපුව | 05 නැගෙනහිර පළාත |
| එරාවුර්පත්තු | 5112 | | |
| මන්මුනේ උතුර | 5118 | | |
| මන්මුනේ බටහිර | 5121 | | |
| කාත්තන්කුඩි | 5124 | | |
| මන්මුනේපත්තු | 5127 | | |
| මන්මුනේ නිරිත | 5130 | | |
| පෝර්තිව්පත්තු | 5133 | | |
| මන්මුනේ දකුණ | 5136 | | |
| කෝරළේපත්තු දකුණ | 5139 | | |
| | | | |
| දෙහිඅත්තකණ්ඩිය | 5203 | 16 අම්පාර | |
| උහන | 5212 | | |
| නාවින්දවෙලි | 5216 | | |
| සම්මන්තුරෙයි | 5218 | | |
| කල්මුණ | 5224 | | |
| සයින්ද මාරුදු | 5225 | | |
| අක්කරෙයිපත්තුව | 5236 | | |
| ආලයඩිවෙම්බු | 5239 | | |
| දමන | 5242 | | |
| තිරුක්කෝවිල් | 5245 | | |
| පොතුවිල් | 5248 | | |
| | | | |
| කුච්චවෙලි | 5306 | 17 ත්‍රිකුණාමලය | |
| ගෝමරන්කඩවල | 5309 | | |
| මොරවැව | 5312 | | |
| නගර හා කඩවත් | 5315 | | |
| තඹලගමුව | 5318 | | |
| කන්තලේ | 5321 | | |
| කින්නියා | 5324 | | |
| මුතූර් | 5327 | | |
| සේරුවිල | 5330 | | |
| | | | |
| ගිරිබාව | 6103 | 18 කුරුණෑගල | 06 වයඹ පළාත |
| ගල්ගමුව | 6106 | | |
| ඇහැටුවැව | 6109 | | |
| අඹන්පොල | 6112 | | |
| රස්නායකපුර | 6118 | | |
| නිකවැරටිය | 6121 | | |
| මහව | 6124 | | |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය | අයත් දිස්ත්‍රික්කය හා අංකය | අයත් පළාත හා අංකය |
|---|---|---|---|
| පොල්පිතිගම | 6127 | | |
| ඉබ්බාගමුව | 6130 | | |
| ගනේවත්ත | 6133 | | |
| වාරියපොල | 6136 | | |
| කොබෙයිගනේ | 6139 | | |
| බිංගිරිය | 6142 | | |
| බමුණාකොටුව | 6149 | | |
| මාස්පොත | 6151 | | |
| කුරුණෑගල | 6154 | | |
| මල්ලවපිටිය | 6157 | | |
| මාවතගම | 6160 | 18 | |
| රිදීගම | 6163 | කුරුණෑගල | |
| වීරඹුගෙදර | 6166 | | |
| කුලියාපිටිය නැගෙනහිර | 6169 | | |
| කුලියාපිටිය බටහිර | 6172 | | |
| උඩුබද්දාව | 6175 | | |
| පන්නල | 6178 | | |
| නාරම්මල | 6181 | | |
| අලව්ව | 6184 | | |
| පොල්ගහවෙල | 6187 | | 06 |
| පඩුවස්නුවර නැගෙනහිර | 6190 | | වයඹ පළාත |
| පඩුවස්නුවර බටහිර | 6193 | | |
| | | | |
| කල්පිටිය | 6203 | | |
| වනාතවිල්ලුව | 6206 | | |
| කරුවලගස්වැව | 6209 | | |
| නවගත්තේගම | 6212 | | |
| පුත්තලම | 6215 | | |
| මුන්දලම | 6218 | | |
| මහකුඹුක්කඩවල | 6221 | | |
|ආණමඩුව | 6224 | 19 | |
| පල්ලම | 6227 | පුත්තලම | |
| ආරච්චිකට්ටුව | 6230 | | |
| හලාවත | 6233 | | |
| මාදම්පෙ | 6236 | | |
| මහවැව | 6239 | | |
| නාත්තන්ඩිය | 6242 | | |
| වෙන්නප්පුව | 6245 | | |
| දංකොටුව | 6248 | | |
| | | | |

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* | *අයත් පළාත හා අංකය* |
|---|---|---|---|
| කැබිතිගොල්ලෑව | 7106 | 20 අනුරාධපුරය | 07 උතුරු මැද පළාත |
| මැදවච්චිය | 7109 | | |
| මහවිලච්චිය | 7112 | | |
| මධ්‍යම නුවරගම්පළාත | 7115 | | |
| රඹෑව | 7118 | | |
| කහටගස්දිගිලිය | 7121 | | |
| හොරොව්පොතාන | 7124 | | |
| ගලෙන්බිඳුනුවැව | 7127 | | |
| මිහින්තලේ | 7130 | | |
| නැගෙනහිර නුවරගම්පළාත | 7133 | | |
| නාච්චදූව | 7136 | | |
| නොච්චියාගම | 7139 | | |
| රාජාංගනය | 7142 | | |
| තඹුත්තේගම | 7145 | | |
| තලාව | 7148 | | |
| තිරප්පනේ | 7151 | | |
| කැකිරාව | 7154 | | |
| පළුගස්වැව | 7157 | | |
| ඉපලෝගම | 7160 | | |
| ගල්නෑව | 7163 | | |
| පලාගල | 7166 | | |
| | | | |
| හිඟුරක්ගොඩ | 7203 | 21 පොළොන්නරුව | |
| මැදිරිගිරිය | 7206 | | |
| ලංකාපුර | 7209 | | |
| වැලිකන්ද | 7210 | | |
| දිඹුලාගල | 7212 | | |
| තමන්කඩුව | 7215 | | |
| ඇලහැර | 7218 | | |
| | | | |
| මහියංගණය | 8103 | 22 බදුල්ල | 08 ඌව පළාත |
| රිදීමාලියද්ද | 8106 | | |
| මීගහකිවුල | 8109 | | |
| සොරණාතොට | 8115 | | |
| පස්සර | 8118 | | |
| ලුණුගල | 8119 | | |
| බදුල්ල | 8121 | | |
| හාලිඇල | 8124 | | |
| ඌව පරණගම | 8127 | | |
| වැලිමඩ | 8130 | | |

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අංකය* | *අයත් දිස්ත්‍රික්කය හා අංකය* | *අයත් පළාත හා අංකය* |
|---|---|---|---|
| බණ්ඩාරවෙල | 8133 | 22 බදුල්ල | 08 ඌව පළාත |
| ඇල්ල | 8136 | | |
| හපුතලේ | 8139 | | |
| හල්දුම්මුල්ල | 8142 | | |
| | | | |
| බිබිල | 8203 | 23 මොණරාගල | |
| මඩුල්ල | 8206 | | |
| මැදගම | 8209 | | |
| සියඹලාණ්ඩුව | 8212 | | |
| මොණරාගල | 8215 | | |
| බඩල්කුඹුර | 8218 | | |
| වැල්ලවාය | 8224 | | |
| කතරගම | 8227 | | |
| | | | |
| ඇහැලියගොඩ | 9103 | 24 රත්නපුර | 09 සබරගමුව පළාත |
| කුරුවිට | 9106 | | |
| රත්නපුර | 9112 | | |
| ඉඹුල්පෙ | 9115 | | |
| ඕපනායක | 9121 | | |
| පැල්මඩුල්ල | 9124 | | |
| නිවිතිගල | 9136 | | |
| කහවත්ත | 9139 | | |
| ගොඩකවෙල | 9142 | | |
| ඇඹිලිපිටිය | 9148 | | |
| කොලොන්න | 9151 | | |
| කල්තොට | 9154 | | |
| | | | |
| රඹුක්කන | 9203 | 25 කෑගල්ල | |
| මාවනැල්ල | 9206 | | |
| අරණායක | 9209 | | |
| කෑගල්ල | 9212 | | |
| ගලිගමුව | 9215 | | |
| වරකාපොල | 9218 | | |
| බුලත්කොහුපිටිය | 9224 | | |
| යටියන්තොට | 9227 | | |
| දැරණියගල | 9233 | | |
| | | | |

උප ලේඛනය II

**ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ විස්තරාත්මක ලකුණු පරිපාටිය**

සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලබන්නේ අයදුම්පත් කැඳවන ලද අවසන් දිනට පෙර ලබා ගත් කුසලතා සම්බන්ධව හා එයට අදාළ සහතික පත් පමණි. අදාළ සහතිකපත් නිසි පරිදි අදාළ කාල වකවානුවලදී නියමිත නිලධාරීන් සහතික කර තිබිය යුතුයි.

**1.** නායකත්වය - (පාසල් හා ප්‍රජා නායකත්වය) උපරිම ලකුණු 15

1.1 පාසල් මට්ටම

| *ලකුණු ලබා දිය හැකි ක්ෂේත්‍රය* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| පාසල් ශිෂ්‍ය නායක | 05 |
| ක්‍රීඩා නායක | 05 |
| බාලදක්ෂ/ශිෂ්‍යභට/රතු කුරුස යන කණ්ඩායම්වල නායකත්වය දැරීම | 05 |

1.1.1 පාසල් ක්‍රියාකාරිත්වය / නායකත්වය වෙනුවෙන් එක් තනතුරක් සඳහා ලකුණු හිමිවනුයේ එක් අවස්ථාවක දී පමණි. එකම සමිතියක විවිධ තනතුරු අවස්ථා කීපයක දී දරා තිබීම නොසලකා හැරේ.

1.1.2 පාසල් ක්‍රියාකාරිත්වය හෝ නායකත්වය විදුහල්පතිවරයා විසින් සහතික කර තිබිය යුතුයි.

1.1.3 එක් තනතුරකට හිමිවන ලකුණු ප්‍රමාණය 05කි.

1.2 ප්‍රජා මට්ටම

| *ලකුණු ලබා දිය හැකි ක්ෂේත්‍රය* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| ප්‍රාදේශීය ලේකම් / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හෝ රජයේ ආයතනයක ලියාපදිංචි දේශපාලන ක්‍රියාකාරිත්වයෙන් තොර සංවිධානයක / සමිතියක ප්‍රධාන ධුර (සභාපති, ලේකම්, භාණ්ඩාගාරික) සඳහා | 05 |
| දහම් පාසලක ගුරුවරයෙකු ලෙස අවම වසරක කාලයක් සේවය කර තිබීම | 05 |

1.2.1 එක් සමිතියක අවස්ථා කිහිපයක දී හෝ එක් අවස්ථාවක දී තනතුරු කිහිපයක් දරා ඇති අවස්ථාවල දී ලකුණු හිමිවන්නේ එක් තනතුරක් සඳහා පමණි.

1.2.2 එක් තනතුරකට හිමිවන ලකුණු ප්‍රමාණය 05කි.

1.2.3 මෙම නිලතල දැරූ බවට අදාළ ලියාපදිංචි අධිකාරියේ බලයලත් නිලධාරියකු හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නිල මුද්‍රාව සහිතව සනාථ කර තිබිය යුතුයි.

1.2.4 දහම් පාසලක ගුරුවරයකු ලෙස වසරක කාලයක් සේවය කර තිබීම.(ප්‍රාදේශීය ලේකම්වරයා හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අදාළ නිලධාරියකු විසින් නිල මුද්‍රාව සහිතව සහතික කළ යුතුය)

1.2.5 අදාළ සංවිධානය / සමිතිය පිළිගත් අධිකාරියක් යටතේ ලියාපදිංචි කර ඇති බව ලියාපදිංචි සහතික හෝ ලිපි ශීර්ෂයේ ලියාපදිංචි අධිකාරිය හා ලියාපදිංචි අංකය සටහන්ව තැබීමෙන් තහවුරු කළ යුතුයි.

**2.** ක්‍රීඩා කුසලතා - උපරිම ලකුණු 05 (පාසල්, ප්‍රාදේශීය/ පර්ෂද/කලාප, දිස්ත්‍රික් මට්ටම්වල ක්‍රීඩා තරගවලදී ලකුණු ලබාදීම, පිළිගත් ක්‍රීඩා සමාජ/යෞවන සමාජ ක්‍රීඩා තරගවල ක්‍රීඩා ඉසව්වලට පමණක් සීමා වේ. අවුරුදු උත්සව වැනි අවස්ථාවල දී පවත්වන ක්‍රීඩා ඉසව් ආදිය සඳහා ලකුණු නොලැබේ.)

- ලබා ගත් ජයග්‍රහණයන්, එම අවස්ථාවේ දී නිකුත් කළ සහතිකවලින් සනාථ කළ යුතු අතර ලිපි මඟින් කරනු ලබන සනාථ කිරීම් සලකා බලනු නොලැබේ.
- එකිනෙකට වෙනස් ඉසව් සඳහා වෙන වෙනම ලකුණු ලබා දෙනු ලැබේ.
- එක් ඉසව්වක් සඳහා ලකුණු හිමිවන්නේ එහි උපරිම දක්ෂතාව සඳහා එක් වරක දී පමණි.
- ජයග්‍රහණ ලෙස සලකනු ලබන්නේ ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන පමණි.

2.1 පාසල්

| *ජයග්‍රහණ* | *ලකුණු ප්‍රමාණය* |
|---|---|
| පාසල් මට්ටමේ (නිවාසාන්තර තරග) ජයග්‍රහණ | 01 |
| කොට්ඨාස මට්ටමේ ජයග්‍රහණ | 02 |
| කලාප මට්ටමේ ජයග්‍රහණ | 03 |

| ජයග්‍රහණ | ලකුණු ප්‍රමාණය |
|---|---|
| පළාත් මට්ටමේ ජයග්‍රහණ | 04 |
| සමස්ත ලංකා මට්ටමේ ජයග්‍රහණ | 05 |

2.2 <u>ක්‍රීඩා සමාජ/ යෞවන සමාජ</u>

| ජයග්‍රහණ | ලකුණු ප්‍රමාණය |
|---|---|
| ප්‍රාදේශීය මට්ටමේ ජයග්‍රහණ | 02 |
| දිස්ත්‍රික් මට්ටමේ ජයග්‍රහණ | 03 |
| පළාත් මට්ටමේ ජයග්‍රහණ | 05 |
| ජාතික මට්ටමේ ජයග්‍රහණ | 05 |

**3.** **<u>භාෂා ප්‍රවීණතාව</u>** - උපරිම ලකුණු 10

3.1 මව් භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව හා සන්ධාන භාෂා ප්‍රවීණතාව (සිංහල/දෙමළ/ ඉංග්‍රීසි) වෙනුවෙන් ලබා දී ඇති පහත සඳහන් ප්‍රවීණතාවන් වෙනුවෙන් ලකුණු හිමිවේ.

3.2 පිළිගත් විශ්වවිද්‍යාලයකින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන උසස් අධ්‍යාපන ආයතනයකින් හෝ භාෂා අධ්‍යාපනය සම්බන්ධයෙන් වගකීම් පැවරී ඇති රාජ්‍ය ආයතනයක්/දෙපාර්තමේන්තුවක් විසින් ලබා දෙනු ලබන සහතික පමණක් සලකා බලනු ලැබේ.

| විභාගය/පාඨමාලාව | ලකුණු ප්‍රමාණය |
|---|---|
| අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විශිෂ්ට සාමාර්ථයකට | 02 |
| අ.පො.ස. (උසස් පෙළ) සම්මාන සාමාර්ථයකට | 04 |
| අ.පො.ස. (උසස් පෙළ) විශිෂ්ට සාමාර්ථයකට | 06 |
| මාස 06 ට වැඩි අර්ධ කාලීන පාඨමාලාවකට | 08 |
| මාස 06 ට වැඩි පූර්ණ කාලීන පාඨමාලාවකට | 10 |

| විභාගය/පාඨමාලාව | ලකුණු ප්‍රමාණය |
|---|---|
| සන්ධාන භාෂාවෙන් (ඉංග්‍රීසි) උපාධිය සමත්වීම (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් උපාධි පමණක් සලකා බලනු ලැබේ.) | 10 |

**4.** **<u>පරිගණක දැනුම</u>** - උපරිම ලකුණු 10

| විභාගය/පාඨමාලාව | ලකුණු ප්‍රමාණය |
|---|---|
| අ.පො.ස. (සාමාන්‍ය පෙළ) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (ICT) විෂයය සඳහා විශිෂ්ට සාමර්ථයකට | 05 |
| අ.පො.ස. (උසස් පෙළ) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (ICT) විෂයය සඳහා සාමාන්‍ය සාමර්ථය හෝ ඉන් ඉහළ සාමර්ථයකට | 06 |
| මාස 06 ට වැඩි පාඨමාලාවක් අවසානයේ නිකුත් කළ සහතිකපත්‍ර /NVQ 03 හෝ ඉන් ඉහළ සුදුසුකම් | 10 |

- **පරිගණක පාඨමාලාවන් සඳහා ලකුණු ලබා දීමේ දී**

  පිළිගත් විශ්වවිද්‍යාලයකින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන උසස් අධ්‍යාපන ආයතනයකින් හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රතිතනය කරන ලද හා නිකුත් කරනු ලබන ආයතනයේ උක්ත කොමිෂන් සභාවේ ලියාපදිංචිය වලංගු කාලය තුළ අවසන් කරන ලද පාඨමාලා සඳහා නිකුත් කරන ලද සහතික පමණක් සලකා බලනු ලැබේ.

**5.** **<u>සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවයන් වෙනුවෙන්</u>** - උපරිම ලකුණු 10

- පෞරුෂත්වය සඳහා සහ සන්නිවේදන කුසලතා සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු ලබා දෙනු ලැබේ.